**විවිධ විදේශාධාර යටතේ පාලම් 46 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ ව්‍යාපෘතිය - 2015**

-------------------------------------------------------------------------------------------------

විවිධ විදේශාධාර යටතේ පාලම් 46 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ප්‍රංශ නැටික්සිස් බැන්ක් ඔෆ් ෆ්‍රාන්ස් (NATIXIS Bank of France) සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර එළඹි අංක බී92 0ඒ1 2012 නොවැම්බර් 05 දිනැති ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**1.2 <u>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම,අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය</u>**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ශ්‍රී ලංකාවේ වානේ පාලම් 46 ක් සපයා ඉදිකිරීමයි. ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය යූරෝ මිලියන 45.80 කට සමාන රු. මිලියන 7,564 ක් වන අතර ඉන් රු. මිලියන 3,642 කට සමාන යූරෝ මිලියන 22.05 මූල්‍යයනය කිරීම සඳහා ප්‍රංශයේ නැටික්සිස් (NATIXIS) බැංකුව එකඟවී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2013 ජූලි 17 දින ආරම්භ කරන ලද අතර 2015 ජූලි 17 වන විට නිමකිරීමට අපේක්ෂා තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු 2015 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මකව පැවතුණි.

**1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමත් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 <u>විගණකගේ වගකීම</u>**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

**(අ)** අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සැහීමට පත්වන පරිදි සැසඳීම කර තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගතවූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයන්ට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවූයේද යන බව.

## 1.5 තත්වාගණන විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයෙන් දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගණකාධිකරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මාර්ග සංවර්ධන අධිකාරිය හරහා අවසර ලත් වාණිජ බැංකුවකින් ලබාගත් රු.මිලියන 471.71 ක් වූ විශේෂ ණය මුදල, මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ ජංගම බැරකම් ලෙස පෙන්නුම් කර තිබුණි. ව්‍යාපෘතිය ණය ආපසු ගෙවීමට එකඟවූ ක්‍රමවේදය විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල් වැරදි ආකාරයට ගණනයට කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පාලම් 6 ක් නැවත ඉදිකිරීම සඳහා එකඟවූ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රු.මිලියන 20.88 ක් වැඩිපුර දක්වා තිබුණි. තවද, පාලම් 9 ක නැවත ඉදිකිරීම් වැඩ සඳහා එකඟවූ කොන්ත්‍රාත්කරුවන් සඳහා ගෙවිය යුතු ශේෂය එකතු රු.මිලියන 83.29 හා 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රඳවුම් මුදල් එකතු රු.මිලියන 13.66 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) වැඩපුර්ව අත්තිකාරම් ශේෂය එකතුව රු.මිලියන 174.83 ක් ආපසු අයකර ගත් මුදලේ වැරදි ගිණුම්කරණ ප්‍රතිකර්ම හේතුවෙන් රු.මිලියන 37.39 කින් වැඩිපුර දක්වා තිබුණි.

(ඈ) ව්‍යාපෘති කාලය තුල කොන්ත්‍රාත්කරුවන් හරහා මිළදී ගත් රු.මිලියන 1.32 ක වටිනාකම වූ ලී බඩු හා උපකරණ ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

ව්‍යාපෘති මූල්‍යයනය, සමාලෝචිත වර්ෂයේ අයවැය ප්‍රතිපාදන හා සමාලෝචිත වර්ෂය තුල අරමුදල් උපයෝජනය හා 2015 දෙසැම්බර් 31 දක්වා අදාල වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂයේ අයවැයගත ඇස්තමේන්තු ප්‍රතිපාදනය | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
| | යූරෝ මිලියන | රුපියල් මිලියන | රුපියල් මිලියන | යූරෝ මිලියන | රුපියල් මිලියන | යූරෝ මිලියන | රුපියල් මිලියන |
| ප්‍රංශයේ නැටික්සිස් බැංකුව | 22.05 | 3.642 | 725 | 4.50 | 719 | 22.39 | 3.551 |
| ශ්‍රී ලංකා රජය | 23.75 | 3.922 | 1.049 | 6.88 | 1.050 | 10.82 | 1.700 |
| | 45.80 | 7.564 | 1.774 | 11.38 | 1.769 | 33.21 | 5. 251 |

## 3.2 භෞතික කාර්යසාධනය

ව්‍යාපෘතිය ආරම්භයේදී පාලම් 46 ක් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබුණද පාලම් සංරචක 50 සැපයීම සඳහා රු. මිලියන 3,642 කට සමාන යූරෝ මිලියන 22.05 ක කොන්ත්‍රාත්තුවක් 2012 දෙසැම්බර් 12 දින විදේශීය සමාගමකට ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්තු ගිවිසුමේ වගන්ති 17 අනුව පාලම් සංරචක උපයෝගී යන්ත්‍ර සමඟ දින 730 ක් ඇතුලත සැපයීම් කළ යුතුය. ඒ අනුව සියළුම පාලම්වල සංරචක සැපයීම සමාලෝචිත වර්ෂය තුල සම්පූර්ණ කර තිබූ අතර ඉන් පාලම් 31 ක ප්‍රතිසංස්කරණ වැඩ පමණක් 2015 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණි. කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමේ ප්‍රමාදය හේතුවෙන් පාලම් 19 ක ප්‍රතිසංස්කරණ වැඩ 2015 දෙසැම්බර් 31 දිනට නිමකර නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත්තු පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය නිකුත් කළ මඟපෙන්වීම්වලට අනුව ව්‍යාපෘති ඉංජිනේරුවරයා අන්තර් ගෙවීම් සහතික දින 21 ක් ඇතුළත පරීක්ෂාකොට සහතික කර ගෙවීම් සඳහා ඉදිරිපත් කිරීම අවශ්‍ය වන අතර ඊළඟ දින 14 ඇතුළත නිරවුල් කිරීම සිදුකළ යුතුය. කෙසේවුවත්, පාලම් 9 නැවත ඉදිකිරීම්වලට අදාල රු. මිලියන 96 ක කොටස් ගෙවීම් සමාලෝචිත වර්ෂය තුල ව්‍යාපෘති ඉංජිනේරුවරයාගේ පරීක්ෂාකිරීම් හා සහතිකකිරීම් වලින් තොරව සිදුකොට තිබුණි.

(ආ) කටුකුරුන්ද - නෑබොඩ මාර්ගයේ පාලම් අංක 12/3 නැවත ඉදිකිරීම් වැඩවලට අදාල දින 14 ක කාලය දික්කිරීම් 2014 ජූලි 01 දක්වා පමණක් අනුමත කර ඇතත්, නැවත ඉදිකිරීම් වැඩ 2014 දෙසැම්බර් 05 දින සම්පූර්ණ කර තිබුණි. කෙසේවෙතත්, රු.මිලියන 12.03 ක අවසන් ගෙවීම ප්‍රමාද දඩ රු.මිලියන 1.14 ක් ආපසු අයකර ගැනීමකින් තොරව නිරවුල් කර තිබුණි. තවද, මාකොළ - උඩුපිල මාර්ගයේ පාලම් අංක 10/1 හා ඉංගිරිය - හල්වතුර එග්ගල්ඔය මාර්ගයේ පාලම් අංක 5/4 නැවත ඉදිකිරීම් පිළිවෙලින් දින 36 හා දින 56 කින් ප්‍රමාද කර නිමකර තිබූ නමුත් ඊට අදාල ප්‍රමාද දඩ තීරණය කොට නැවත ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර නොතිබුණි.

(ඇ) 2012 අගෝස්තු 07 දිනැති අංක 2/2012 රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව ප්‍රසම්පාදන පිරිවැය ඇස්තමේන්තු කිරීමේදී ඊට අදාල සියළු කරුණු සැලකිල්ලට ගෙන මුළු ප්‍රසම්පාදන පිරිවැය නිවැරදි බවට සනාථ කර ගත යුතුය. කෙසේවෙතත්, ප්‍රතිසංස්කරණ කටයුතුවල විෂයපථ වෙනස්වීම් හා දුර්වල ජ්‍යාමිතික සැලසුම්වල ප්‍රතිඵලයක් ලෙස පාලම් 09 ප්‍රතිසංස්කරණවල රු.මිලියන 102.65 ක මුල් ඇස්තමේන්තු පිරිවැයෙහි රු.මිලියන 64.33 ක විචලනයක් සිදුකර තිබුණි.

(ඈ) වදුරඹ - ඇතිමලේ- යක්කටුව මාර්ගයේ පාලම් අංක 33/1 පාලමේ පයින් ගමන් කරන කොටසේ කොන්ක්‍රීට් ආවරණ තීරුව ඉරිතැලීම් සිදුවී තිබූ අතර ගැල්වනයිස් ආධාරක නිසි ලෙස සවිකර නොමැති බව 2016 පෙබරවාරි 15 දින විගණකවරුන්ගේ ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය. තවද, පාරිසරික කරුණු හේතුවෙන් බදුල්ල දුම්රියපොල මාර්ගයේ පාලම් අංක 1/1 ප්‍රතිසංස්කරණ වැඩ අත්හිටුවා තිබුණි.

(ඉ) කොන්ත්‍රාත්තු ගිවිසුමට සම්බන්ධ අතිරේක iv(උ) අනුව ප්‍රතිසංස්කරණ හා නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය සැපයුම්කරු සම්පාදනය කළ යුතු අතර ඉංජිනේරුවරුන් 15 දෙනෙකු ඒ සඳහා පුහුණු කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, මාර්ග සංවර්ධන අධිකාරිය ඉංජිනේරුවන් 3 දෙනෙකුට පමණක් ව්‍යාපෘති කාලය තුල විදේශීය පුහුණුව සලසාදී තිබුණි. ප්‍රමාණවත් තාක්ෂණික දැනුම නොමැති කාර්යමණ්ඩල හිඟකම නැවත ඉදිකරන ලද පාලම්වල අනාගත නඩත්තු කටයුතු සඳහා බලපාන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3.4 <u>මතභේදයට තුඩුදෙන කරුණු</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකරණ ඒකකය විසින් විවිධ විදේශාධාර අරමුදල් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද නමුත්, විදුලිය, ගොඩනැගිලි කුලී, පුවත්පත් හා විදුලි සංදේශ ආදී ව්‍යාපෘති කළමනාකරණ වියදම් රු. මිලියන 2.17 ක් වෙනත් ව්‍යාපෘති අතර සමානුපාතිකව බෙදාහැරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුල ව්‍යාපෘතියට අයකර තිබුණි.

**(ආ)** කාර්මික නිළධාරීන්ගේ දීමනා වැරදි ආකාරයට ගණනය කර තිබූ අතර රු.161,000 ක් වැඩිපුර ගෙවා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3.5 <u>මානව සම්පත් කළමනාකරණය</u>**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව කාර්යමණ්ඩලය 33 ක් අනුමත කරන ලද නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ කාර්යමණ්ඩලයේ සාමාජිකයින් 18 කින් සමන්විත බව නිරීක්ෂණය විය. ව්‍යාපෘතියේ ප්‍රධාන තනතුරු වන ඉංජිනේරුවන් 6 හා කාර්මික නිළධාරීන් 5 ක් 2015 දෙසැම්බර් 31 දිනට වසර 3 ටත් වඩා කාලයක් පුරප්පාඩුව් තිබුණි. කෙසේවුවද, ව්‍යාපෘතිය විසින් අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවූ උපදේශක තනතුරු සඳහා නිළධාරීන් 03 දෙනෙකු, සැහැල්ලු යන්ත්‍ර ක්‍රියාකරුවෙකු සහ පරිගණක කාර්මිකයෙකු සේවයේ යොදවා තිබුණි.

**3.6 <u>මූල්‍ය පාලනයට අදාල කරුණු</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 2007 අප්‍රේල් 05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 33 හි 5.4 වගන්තියට පටහැනිව මාර්ග සංවර්ධන අධිකාරියෙන් ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයට අනුයුක්ත කළ නිළධාරීන්ගේ වෛද්‍ය නිවාඩු මුදල් කිරීම් රු.95,698 ක් හා ප්‍රසාද දීමනා ගෙවීම් රු.101,250 ක් මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රතිපූර්ණය කර තිබුණි.

**(ආ)** අන්තර් ගෙවීම් සහතික හරහා මිළදීගත් රු. මිලියන 2.24 ක් වටිනා ලී බඩු හා උපකරණ මුදල් රෙගුලාසි අංක 756 හි අවශ්‍යතාවයට අනුව වාර්ෂික සමීක්ෂණ මණ්ඩලයක් මඟින් සනාථ කර නොතිබුණි.

**(ඇ)** වෙනත් අරමුදල් ආධාර ව්‍යාපෘතියක් සඳහා යෙදවූ උපදේශකවරයෙකුට හා සම්බන්ධීකරන නිළධාරියෙකුට වැටුප් හා මෝටර් වාහන කුලී ගාස්තු එකතුව රු.293,393 ක් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

**3.7 <u>ව්‍යාපෘති කටයුතු අවසන් කිරීම</u>**

2015 දෙසැම්බර් 31 දිනට නැවත ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කළ පාලම් 17 ක නැවත ඉදිකිරීම්වලට සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන් හරහා ප්‍රසම්පාදනය කළ රු. මිලියන 2.27 ක ලී බඩු හා උපකරණ මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී නොතිබුණි.